# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

තරිඳු ජයවර්ධන මහතා,
සමාජය සහ සාමයික
කේන්ද්‍රය
281 ඩීන්ස් පාර
කොළඹ10

<u>**අභියාචක**</u>

**අභියාචනා අංකය :**
**RTIC/Appeal/1134/2022**

එදිරිව

ශ්‍රී ලංකා ගුවන් හමුදා
මූලස්ථානය
ත.පෙ.594
කොළඹ

<u>**පොදු අධිකාරිය**</u>

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. ඒ.එම්. නහියා - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක සිටී. අභියාචක වෙනුවෙන් නීතිඥ සුරේන් ඩී. පෙරේරා මයා සහ නීතිඥ මනුෂිකා කුරේ මිය පෙනී සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීමක් නැත.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය :** 2023.02.02, 2023.04.04

**තීරණය කළ දිනය :** 2023.04.04

<u>**කොමිෂන් සභාවේ තීරණය**</u>

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2022.08.13 දිනැති තොරතුරු ඉල්ලීම මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය වෙතින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා ගුවනින් කළ සංචාරවලට අදාළව 2022.04.01 සිට 2022.07.15 දක්වා කාලයට අදාළව පහත තොරතුරු ලබා දෙන්න.*

1. අදාළ කාලයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් යානා වලින් ගිය අවස්ථා ගණන කීයද?

2. ඒ එක් එක් අවස්ථා වලට අදාළව ගමන ගිය දිනය, ආරම්භය සහ නැවතුම, ජනාධිපති සමඟ ගිය ගණන, වියදම් වූ සම්පූර්ණ මුදල, එම මුදල ජනාධිපතිවරයා ලෙස රජයෙන් හෝ ගුවන් හමුදාවෙන් දරන වියදමක්ද නැතහොත් ජනාධිපතිවරයාගේ පුද්ගලික වියදමක්ද යන්න

3. එම ගමන් සඳහා අනුමැතිය ලැබුණු ආකාරය ලබා දෙන්න

තොරතුරු නිලධාරි විසින් පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දක්වා නොමැති අතර ඉන්පසු අභියාචක විසින් 2022.09.09 දිනැතිව නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නම් කළ නිලධාරිද පනත ප්‍රකාරව, නියමිත කාලය තුල පිළිතුරු සැපයීමට අපොහොසත්ව ඇති බැවින් 2022.10.20 දිනැතිව අභියාචක විසින් කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරියේ නම් කළ නිලධාරි විසින් මෙම අභියාචනයට අදාළව 2023.01.17 වන දින කොමිෂන් සභාව වෙත ලිපියක් ඉදිරිපත් කරමින් 2022.08.13 දින දරන තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත සහ 2022.09.09 දින දරන නම් කළ නිලධාරි වෙත කරන ලැබූ අභියාචනය යන දෙකම මූලස්ථානය වෙත ලැබී නොමැති බැවින් මීට අදාළව ඉදිරි කටයුතු සිදුවී නොමැති බව දන්වා ඇත.

**සළකා බැලීම**

අද දින පරීක්ෂණය සඳහා නියම කර ඇති දෙවන දිනයයි. කෙසේ වුවත්, පොදු අධිකාරිය වෙනුවෙන් අද දින ද පරීක්ෂණය සඳහා කිසිවෙකු පෙනී නොසිටී.

මෙම අභියාචනය පසුගිය දින, 2023.02.02 වන දින විමසීමට ගනු ලැබූ අවස්ථාවේදී සූම් තාක්ෂණය ඔස්සේ පෙනී සිටි තොරතුරු නිලධාරි මනෝජ් කැප්පෙටිපොළ මහතා සඳහා සඳහන් කරන ලද්දේ පොදු අධිකාරියේ විද්‍යුත් ලිපිනයට අදාළ තොරතුරු ඉල්ලීම නොලැබුණු බවය. මේ සම්බන්ධව සිදු කළ විමසීමේදී පෙනී ගිය අන්දමට ඔවුන්ගේ විද්‍යුත් ලිපිනය (media@airforce.lk) පැහැදිලිව සඳහන්ව තිබූ අතර එකී ලිපිනයට තම තොරතුරු ඉල්ලීම සහ අභියාචනය ඉන්පසුව ගොනු කර තිබූ බවයි.

එසේම, පොදු අධිකාරිය විසින් 2023.01.17 වන දින මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද ලිපියක සඳහන් කර ඇත්තේ තොරතුරු ඉල්ලීම නොලැබී ඇති බවත් කෙසේ නමුත් කොමිෂන් සභාවෙන් එකී තොරතුරු ඉල්ලීම ලැබී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරගෙන යමින් සිටින බවයි.

එසේම, 2023.02.02 වන දින පරීක්ෂණයට සහභාගි වීමෙන් පසුව පොදු අධිකාරිය විසින් මෙම කොමිෂන් සභාවේ පරිපාලන නිලධාරි අමතා ඇති 2023.03.07 වන දිනැති ලිපියෙන් සඳහන් කර ඇත්තේ තොරතුරු ලබා ගැනීම පිණිස අදාළ අංශ වෙත යොමු කර ඇති බවත් ඒ සඳහා දිගු කාලයක් ගත වන බවත් එබැවින් තොරතුරු ලබා දීම සඳහා දින 14 ක දිගුවක් අවශ්‍ය බවත්ය. මේ අනුව එදින සිට අද වන විට දින 14 ක කාල සීමාවකට වඩා කල් ඉකුත්ව ගොස් ඇත.

තොරතුරු මුදා නොහැරීම සම්බන්ධව 2016 අංක 12 දරණ පනතේ 5 (1) වගන්තියේ ව්‍යාතිරේකයන් අදාළ කර ගැනීමට පොදු අධිකාරිය අදහස් කළ බවක් ඉහත සඳහන් ලිපි වලින් නොපෙනේ. එකී ලිපි වලින් පෙනී යන අන්දමට මෙම තොරතුරු බාධාවකින් තොරව පොදු අධිකාරියට මුදා හළ හැකි තොරතුරු බවට පැහැදිලිව සඳහන්ව ඇත.

එබැවින් ඉහත සියලු කරුණු සළකා බලා අභියාචක විසින් ඉල්ලා ඇති ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමේ සියලුම තොරතුරු 2023.04.28 වන දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවටද වැඩිදුරටත් තීරණය කරමු.

එසේම, “2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)” රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.